# التوبة

# පාපොච්චාරණය

سنهالي


المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
E.mail : Sultanah22@hotmail.com
THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH
Tel:4240077 Fax:4251005 P.O.Box:92675 Riyadh:11663 K.S.A. E-mail: sultanah22@hotmail.com

# التوبة

أعده وترجمه للغة السنهالية

## شعبة توعية الجاليات بالزلفي

الطبعة الأولى: ١٤٢٤/٥


ح شعبة توعية الجاليات بالزلفي؛ ١٤٢٤هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات بالزلفي

التوبة ؛ شعبة توعية الجاليات بالزلفي ، الزلفي ١٤٢٤هـ

٤٨ ص ؛ ١٧سم

ردمك : ٧-١٩-٨٦٤-٩٩٦٠

باللغة السنهالية

١- التوبة ( الإسلام ) أ – العنوان

ديوي ٢٤٠ ١٤٢٤/٢٧٢٨

رقم الإيداع : ١٤٢٤/٢٧٢٨

ردمك : ٧-١٩-٨٦٤-٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# التوبة
# පාපොච්චාරණය

පාපොච්චාරණය කිරීම පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසන්නේය.

﴿وَمَنْ يَعْمَلْ سُوءاً أَوْ يَظْلِمْ نَفْسَهُ ثُمَّ يَسْتَغْفِرِ اللَّهَ يَجِدِ اللَّهَ غَفُوراً رَحِيماً﴾

[النساء : ١١٠]

කවරෙක් අකුසලක් කර හෝ තමාටම අපරාධයක් කර පසුව අල්ලාහ්ගෙන් පව් සමාව අයැද සිටින්නේද, ඔහු අල් ලාහ්ව කමා වන්තයා හා කරුණා වන්තයා ලෙස දකී.
(අල්කුර්ආන් - 4:110)

## පාපොච්චාරණයේ විශේෂත්වය

ඉබ්රාහීම් බින් අද්හම් (රහ්) තුමා හමුවට පුද්ගලයෙක් පැමිණ 'මා අධික පාප ක්‍රියාවන්හි නිරතව සිටින බැවින්, මාහට උපදෙස් කරන්න' යනුවෙන් එතුමාගෙන් ඉල්ලීමක් කළේය. එය පිළිගත් එතුමා 'ඔබට කරුණු පහක් කෙරෙහි මම උපදෙස් කරමි. ඒවා නිසියාකාරව අනුගමනය කිරීමට ඔබට හැකි නම්, කිසියම් පාපයක් ඔබට බාධා නොකරයි' යැයි පැවැසීය. පසුව ඔහු ඒවා කුමක්ද ? යැයි එතුමාගෙන් විමසීය. එකළ එතුමා 'ඔබ අල්ලාහ්ට විරුද්ධකම් කිරීමට අදහස් කළේ නම්, ඔහුගේ ආහාරය අනුභව නොකරන්න' යනුවෙන් පැවැසූවිට ඔහු 'මේ විශාල පොළෝවේ ඇති සෑම

දේ ඔහුගේ අහාරය. එනම්, මා ආහාර ගන්නේ කෙසේද ?' යනුවෙන් ඇසීය. එකල එතුමා 'ඔහුගේ ආහාරය අනුභව කරමින් ඔහුටම වෙනස්කම් කිරීම සාධාරණයක්ද ?' යැයි ඔහුගෙන් ඇසූ විට ඔහු 'මව් වෙනස්කම් නොකළ යුතුයි. දෙවැනි කරුණ කුමක්ද ? යනුවෙන් විමසීය.

පසුව එතුමා 'ඔබ අල්ලාහ්ට වෙනස්කම් කිරීමට අදහස් කළේනම්, ඔහුගේ පොළොවෙහි වාසය නොකරන්න' යැයි පැවැසීය. එකල ඔහු 'මෙය පළමු කරුණට වඩා බරපතල එකකි. එසේ නම්, මම වාසය කරන්නේ කෙසේද ?' යැයි ඇසීය. වහාම එතුමා ඔහුගේ ආහාරය අනුභව කරමින් හා ඔහුගේ පොළොවෙහි ජීවත්වමින් ඔහුටම වෙනස්කම් කිරීම සාධාරණයක්ද ?' යැයි ඇසූවිට ඔහු 'මව් එය අසාධාරණයකි. තෙවැනි කරුණ කුමක්ද ?' යනුවෙන් විමසීය.

පසුව එතුමා 'ඔබ අල්ලාහ්ට වෙනස්කම් කිරීමට අදහස් කළේනම්, ඔහුගේ බැල්මට හසු නොවන ප්‍රදේශයක් කරා ගමන් කරන්න' යැයි පැවැසීය. එකල ඔහු 'ලොවෙහි රහස් ගත හා නොරහස්ගත සෑම තැන්හි ඔහුගේ බැල්ම ව්‍යාප්තව පවතින හෙයින්, මා කුමණ ප්‍රදේශයකටද යන්නේ ?' යැයි ඇසීය. වහාම එතුමා 'ඔබ ඔහුගේ ආහාරය අනුභව කර, ඔහුගේ පොළොවෙහි වාසය කර හා ඔහුගේ බැල්මට හසුවී සිටිනවිට ඔහුටම වෙනස්කම් කිරීම සාධාරණයක්ද ?' යැයි ඇසූ කල ඔහු 'මව්, එයනම් අසාධාරණයකි. සිව්වැනි කරුණ කුමක්ද ?' යැයි විමසීය.

පසුව එතුමා 'ඔබගේ ප්‍රාණය අත්පත් කිරීම සඳහා එයට අදාල දේව දූතයා (මලකුල් මව්ත්) ඔබ වෙතට පැමිණ විට

"මා පාපොච්චාරණය කර යහකම් කිරීම සඳහා සුළු කාල යකට මාගේ ආයුෂ කාලය ප්‍රමාද කරන්න" යැයි එම දේව දූතයාගෙන් ඉල්ලන්න' යනුවෙන් පැවැසීය. එකල ඔහු 'එම දූතයා මාගේ ඉල්ලීම පිළි නොගන්නා අතර, මාගේ ආයුෂ කාලයද ප්‍රමාද නොකරයි' යැයි කීය. වහාම එතුමා 'ඔබ පාපොච්චාරණය කර යහකම් කිරීම සඳහා ඔබගේ මරණ යෙන් වැළකී සිටීමට ඔබට හැකියාවක් නොවන්නේ නම්, ඔබ ඔහුට වෙනස්කම් කළ හැකිද ?' යැයි පැවැසීය. එයට ඔහු 'එසේමයි වෙනස්කම් නොකළ යුතුයි. පස්වන කරුණ කුමක්ද ?' යැයි විමසීය.

පසුව, එතුමා 'පරලොව දිනයෙහි ඔබව අපායට ගෙන යාම සඳහා සබානියාවරුන් (අපායේ සේවකයින්) ඔබ වෙත පැමිණියේනම් ඔබ ඔවුන් සමග නොයන්න' යැයි පැවැසීය. එයට ඔහු 'ඔවුන් එය පිළි නොගන්නා අතර මාවද අතහැර නොයති' යැයි කීය. එකල එතුමා 'එසේ නම්, ඔබ එයින් ජයග්‍රහණය කරන්නේ කෙසේද ?' යනුවෙන් විමසීය. එයට ඔහු 'මේවා මට ප්‍රමාණවත් වේ. මාගේ ස්වාමියාවූ අල්ලාහ් ගෙන් පව සමාව අයැද පාපොච්චාරණය කරමි' යැයි කීය.

පාපොච්චාරණය කිරීමෙහි යෙදෙන මෙන් අල්ලාහ් තම විශ්වාසනීය දාසයන් අමතා පවසන්නේ මෙසේය.

﴿وَتُوبُوا إِلَى اللهِ جَمِيعًا أَيُّهَا الْمُؤْمِنُونَ لَعَلَّكُمْ تُفْلِحُونَ﴾ [النور: ٣١]

තවද අහෝ විශ්වාස වන්තයිනි, ඔබලා ජයග්‍රහණය කර ගැනීම සඳහා අල්ලාහ් වෙතින් පාපොච්චාරණය කර (පව සමාව ඉල්ලා) සිටින්න.

(අල්කුර්ආන් - 24:31)

දාසයන් ප්‍රධාන වශයෙන් පාපොච්චාරණය කරන්නා හා සිය ආත්මයටම අපරාධ කරන්නා යනුවෙන් බෙදෙති. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَمَنْ لَّمْ يَتُبْ فَأُولَئِكَ هُمُ الظَّالِمُوْنَ﴾ [الحجرات: ١١]

තවද කවරෙහු (පාපයෙන් මිදීම සඳහා) පාපොච්චාරණය නොකරන්නේද, අපරාධ කරුවන් ඔවුන්මය.

(අල්කුර්ආන්-49:11)

පාපොච්චාරණය කිරීමේ අවශ්‍යතාවය මිනිස් හදවත් තුළ ස්ථිරව තිබිය යුතුයි. නබිනායක මුහම්මදු (සල්) තුමාණෝ පවසා ඇති පරිදි සැබැවින්ම, ආදම්ගේ පුත්‍රයන් (මිනිසුන්) සැම දෙනා වැරදි කරන්නන්ය. ඔවුන් අතර ශ්‍රේෂ්ඨවන්තයා පාපොච්චාරණය කරන්නාය.

මිනිසුන්ගෙන් බොහෝ දෙනා පාප ක්‍රියාවන්හි යෙදීමට හේතුව ඔවුහු එවැනි පාපයන් කෙරෙහි නොසැළකිළිමත් වීමය. එහෙයින්, ඔවුහු දිවා හා රාත්‍රී නොබලා අල්ලාහ්ට එරෙහි පාප ක්‍රියාවල යෙදෙති. ඔවුන්ගෙන් සමහරුන් පාප ක්‍රියාවන් සුළු වශයෙන්ද, සාමාන්‍ය ලෙසද හා සාධාරණය ලෙසද සළකති.

නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

[إنَّ الْمُؤْمِنَ يَرَى ذُنُوْبَهُ كَأَنَّهُ قَاعِدٌ تَحْتَ جَبَلٍ يَخَافُ أَنْ يَقَعَ عَلَيْهِ ، وَإِنَّ الْفَاجِرَ يَرَى ذُنُوْبَهُ كَذُبَابٍ مَرَّ عَلَى أَنْفِهِ فَقَالَ بِهِ هَكَذَا-أي بيده-فَذَبَّهُ عَنْهُ] (البخاري)

නියත වශයෙන්ම, විශ්වාස වන්තයා තම පාප කාර්යයන් තම මත වැටේ දැයි බියවන කන්දක යට වාඩිවී සිටින සේ

දකී. පාප කරුවා තම පාප කාර්යයන් තම නාහය පසුකර ගිය මැස්සෙකු සේ දැක, එය මහු සිය අතින් එළවා දමයි.

(ග්‍රන්ථය : බුහාරි)

නියතව, බුද්ධිමත් විශ්වාස වන්තයා පාප කාර්යයන් සුළු ලෙස නොසළකයි. නමුදු පාපයක් සිදුවූ කළ එය මහු ඉතා විශාලමත් ලෙස සළකයි. මිනිසා පාප ක්‍රියාවල යෙදෙන ස්ව භාවයෙන් සිටින නිසා අල්ලාහ් මහු වෙනුවෙන් පාපොච්චාර ණයෙහි දොරටුව විවෘතකර එහි යෙදෙන මෙන් අණ කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿قُلْ يَا عِبَادِيَ الَّذِينَ أَسْرَفُوا عَلَى أَنْفُسِهِمْ لا تَقْنَطُوا مِنْ رَحْمَةِ اللَّهِ إِنَّ اللَّهَ يَغْفِرُ الذُّنُوبَ جَمِيعاً إِنَّهُ هُوَ الْغَفُورُ الرَّحِيمُ﴾ [الزمر:٥٣]

'තම ආත්මයට (එරෙහිව තමන් විසින්ම) සීමා ඉක්මවා ගොස් (අපරාධකර) සිටින මගේ දාසයිනි. අල්ලාහ්ගේ දායා දයන් (පව් සමාව) පිළිබඳ අපේක්ෂාව නැති නොකරන්න. නියත වශයෙන්ම, අල්ලාහ් (ඔබලාගේ) සැම පාපයන් සඳ භාම (ඔබලා පාපොච්චාරණය කළේනම්) සමාව ලබා දෙයි. (මක්නිසාද යත්) නිසැකයෙන්ම ඉමහත් සමාවනීය කරුණා වන්තයා මහුමය වේ' යැයි (නබි) ඔබ පවසන්න.

(අල්කුර්ආන් -39:53)

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[التَّائِبُ مِنَ الذَّنْبِ كَمَنْ لاَ ذَنْبَ لَهُ] (رواه ابن ماجة)

(තමා කළ) පාප ක්‍රියාවන් වෙනුවෙන් පාපොච්චාරණය කරන්නා පාපයන් නොවන්නෙකු සේය.

(ග්‍රන්ථය : ඉබ්නු මාජා)

එපමණක් නොවේ. කරන පාපොච්චාරණය යථාර්ත පූර් වකව සිදුවනවිට අල්ලාහ් අකුසල් සියල්ල කුසල් වශයෙන් පරිවර්තනය කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿إِلاَّ مَنْ تَابَ وَآمَنَ وَعَمِلَ عَمَلاً صَالِحاً فَأُولَئِكَ يُبَدِّلُ اللَّهُ سَيِّئَاتِهِمْ حَسَنَاتٍ وَكَانَ اللَّهُ غَفُوراً رَحِيماً﴾ [الفرقان:٧٠]

(පාපයන් පිළිබඳව) කවරෙක් පාපොච්චාරණය කර, විශ් වාසය කර හා කුසල් ක්‍රියාවන්හි යෙදෙන්නේද, එවැන්නන් ගේ පාප ක්‍රියාවන් කුසල් ක්‍රියාවන් බවට අල්ලාහ් පරිවර්ත නය කරයි. තවද, අල්ලාහ් ඉමහත් කරුණා වන්තයා හා සමාවන්තයා ලෙස සිටින්නේය.

(අල්කුර්ආන් – 25:70)

මුස්ලිම් වරයෙකුගෙන් සිදුවන ඉමහත් පාපය වන්නේ පාපොච්චාරණය කිරීම පමා කිරීමකි. පාපයෙහි යෙදී, එයද (ආගමෙන්) තහනම්වූ කාර්යයක් ලෙස දැන සිටිමින්ද ඒ වෙනුවෙන් පාපොච්චාරණය කිරීම ප්‍රමාද කරන සමහර මිනිසුන්ද සිටිති. මිනිසා තම අවසාන මොහොත (මරණය) කුමන අවස්ථාවක පැමිණේයිද යන්නෙහි නොදනිමින් සිටී. එබැවින්, මිනිසා තම පාපයන් වෙනුවෙන් පාපොච්චාරණය කිරීමට සීඝ්‍රවීම අනිවාර්ය වේ.

එබැවින්, මිනිසා තමා දන්නා හා නොදන්නා සැම පාප කාර්යයන් වෙනුවෙන් පාපොච්චාරණයෙහි වැඩි වැඩියෙන් යෙදීම අනිවාර්ය වෙ. මුස්ලිම්වරයා තම පාපයන් කෙතරම් විශාල වුවද, ඒ වෙනුවෙන් පාපොච්චාරණයෙහි යෙදීමට සීඝ්‍ර වීම අවශ්‍යවේ. මෙය අල්ලාහ්ටම හිමිවූ පාලන බලය තමාට

ඇති බව තර්ක කිරීමට වඩා බරපතල ප්‍රතික්ශේප කිරීමක් නොවන බව දැනගත යුතුයි. මිසර දේශයේ රජකම් කළ ෆිර්අවුන් තම සමාජය අමතා 'අනුගාමිකයිනි, ඔබලාට මා හැර අන්කිසි දෙවි කෙනෙක් සිටින බව මා නොදනිමි' යැයි කීය. එකළ අල්ලාහ් නබි මූසා (අලෛ) තුමාව තම දූතයා ලෙස ෆිර්අවුන් වෙත එව්වේය. එතුමා ඔහුව කැඳවා පාපොච් චාරණය කරන ලෙසත් අල්ලාහ් කෙරෙහි විශ්වාසය කරන ලෙසත් අණ කළේය. අල්ලාහ් එය මෙසේ පවසන්නේය.

﴿اذْهَبْ إِلَى فِرْعَوْنَ إِنَّهُ طَغَى ، فَقُلْ هَلْ لَكَ إِلَى أَنْ تَزَكَّى ، وَأَهْدِيَكَ إِلَى رَبِّكَ فَتَخْشَى﴾ [النازعات :١٧-١٩]

ඔබ ෆිර්අවුන් වෙත යන්න. නියත වශයෙන්ම, ඔහු සීමා ඉක්මවා ගියේය. තවද, (ෆිර්අවුන්ගෙන්, පාපයෙන්) පවිත්‍ර වී (විශ්වාස කිරී)මෙහි කැමැත්ත ඔබට තිබේද ? යනුවෙන් ඔබ අසන්න. එසේනම්, ඔබගේ ස්වාමියා කරා (යායුතු) මාර් ගය මම ඔබට පෙන්වන්නම්. එකළ ඔබ බිය භක්තිකයා වේ. (යනුවෙන් පවසන මෙන් අණ කළේය)

(අල්කුර්ආන්-79:17-19)

මේ අනුව ෆිර්අවුන් අල්ලාහ්ගෙන් පාපොච්චාරණය කර සිටියේනම්, අල්ලාහ් ඔහුට සමාව ලබා දෙන්නට ඇති. දැන ගන්න. පුද්ගලයෙක් පාපයක් වෙනුවෙන් පාපොච්චාරණය කළ පසු, නැවත එම පාපයෙහි යෙදුනේනම්. නැවත වරක් පාපොච්චාරණය කළ යුතුයි. එම පාපය හෝ වෙනත් පාප යක් නැවත නැවත ඔහු කළේනම් පාපොච්චාරණයද නැවත නැවත කළ යුතුයි. එසේම අල්ලාහ්ගේ කරුණාව කෙරෙහි අවිශ්වාස නොකළ යුතුයි.

අල්ලාහ් පවසන බවට නබිනායක මුහම්මද් (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් අනස් (රලි) තුමා වාර්තා කරන්නේය.

[يَاابْنَ آدَمَ إِنَّكَ مَا دَعَوْتَنِي وَرَجَوْتَنِي غَفَرْتُ لَكَ عَلَى مَاكَانَ فِيْكَ وَلاَ أُبَالِي ،
يَاابْنَ آدَمَ لَوْ بَلَغَتْ ذُنُوْبُكَ عَنَانَ السَّمَاءِ ثُمَّ اسْتَغْفَرْتَنِي غَفَرْتُ لَكَ وَلاَ أُبَالِي ،
يَاابْنَ آدَمَ إِنَّكَ لَوْ أَتَيْتَنِي بِقُرَابِ الأَرْضِ خَطَايَا ثُمَّ لَقِيْتَنِي لاَ تُشْرِكُ بِي شَيْئًا
لأَتَيْتُكَ بِقُرَابِهَا مَغْفِرَةً] (رواه الترمذي)

ආදම්ගේ පුත්‍රයෙනි, මා වෙත අපේක්ෂාව තබා මගෙන් ප්‍රාර්ථනා කළේනම්, මා කිසිවක් නොසළකා ඔබ කළ පාප කාර්යයන් සියල්ලටම සමාව ලබාදෙමි. ආදම්ගේ පුත්‍රයෙනි, ඔබ කළ පාපයන් අහස් පිරෙන ප්‍රමාණයට තිබී ඒ ගැන මා වෙත සමාව අයැද සිටියේනම්, මා කිසිවක් නොසළකා ඔබට සමාව ලබා දෙමි. ආදම්ගේ පුත්‍රයෙනි, ඔබ මේ පොළොව පිරෙන තරමට පාපයන් කර, මට කිසිවක් සමාන නොකර මාව බැහ දකින්නේනම්, (පාපොච්චාරණය කළේනම්) එම පොළොව පිරෙන තරමට මගේ සමාව ඔබට ලබා දෙමි.

(ග්‍රන්ථය : තිර්මිදි)

සමහර මිනිසුන් අල්ලාහ්ගේ දායාදයන් පිළිබඳව අවිශ්වාසයෙන් සිටිති. මෙයට හේතුව, අධිකව පාපයෙහි යෙදීම හෝ වරක් හෝ කීප වතාවක් පාපොච්චාරණය කිරීමෙන් පසුද නැවත පාපයෙහි යෙදීම හා අල්ලාහ් තමාහට සමාව නොදෙන බව සිතීමකි. එබැවින් ඔවුහු අඛණ්ඩව පාපයෙහි යෙදෙමින්ම කාලය ගත කරන අතර, පාපොච්චාරණය කිරීමෙන් හා අල්ලාහ්ගෙන් (සමාව) අපේක්ෂා කිරීමෙන් වැළකී සිටිති.

මෙය විශාලම වරද්දකි. මන්ද යත්, නියතව, අල්ලාහ්ට වෙනස්කම් කරන කාෆිර් වරුන් හැර අන් කවරෙක් හෝ අල්ලාහ්ගේ දායදයන් කෙරෙහි අවිශ්වාස නොකරති. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿قُلْ يَاعِبَادِيَ الَّذِيْنَ أَسْرَفُوْا عَلَى أَنْفُسِهِمْ لاَ تَقْنَطُوْا مِنْ رَحْمَةِ اللهِ إِنَّ اللهَ يَغْفِرُ الذُّنُوْبَ جَمِيْعًا، إِنَّهُ هُوَ الْغَفُوْرُ الرَّحِيْمُ﴾ [الزمر:٥٣]

'තම ආත්මයට (එරෙහිව තමන් විසින්ම) සීමා ඉක්මවා ගොස් (අපරාධකර) සිටින මගේ දාසයිනි. අල්ලාහ්ගේ දායාදයන් (පව් සමාව) පිළිබඳ අපේක්ෂාව නැති නොකරන්න. නියත වශයෙන්ම, අල්ලාහ් (ඔබලාගේ) සෑම පාපයන් සඳහාම (ඔබලා පාපොච්චාරණය කළේනම්) සමාව ලබා දෙයි. (මක්නිසාද යත්) නිසැකයෙන්ම ඉමහත් සමාවනීය කරුණාවන්තයා ඔහුමය වේ' යැයි (නබි) ඔබ පවසන්න.
(අල්කුර්ආන්-39:53)

﴿ إِنَّهُ لاَ يَيْأَسُ مِنْ رَوْحِ اللَّهِ إِلَّا الْقَوْمُ الْكَافِرُوْنَ﴾ [يوسف: ٨٧]

නියත වශයෙන්ම ප්‍රතික්ෂේප කරන්නන් (කාෆිර්වරුන්) හැර (අන් කවරෙක් හෝ) අල්ලාහ්ගේ දායාදයන් පිළිබඳව අවිශ්වාසය නොකරති.

(අල්කුර්ආන්-12:87)

සමහරුන් මිනිසුන්ගේ කියමන් කෙරෙහි බියට පත්වී හෝ, තමා ජීවත්වන සමාජයෙහි තම තරාතිරම අහිමවේ යන බියට හෝ, තමා කරන රැකියාව තමාට අහිමවේ යන බියට හෝ සමහර පාපයන් වෙනුවෙන් පාපොච්චාරණයෙහි යෙදීමෙන් වැළකී සිටිති. නමුත්, ඔවුහු තමන් තනිවම මිනී

වළ කරා යාම ගැනද, තම ස්වාමියා ඉදිරියෙහි නැගිටටවීම ගැනද, තම ක්‍රියාවන් පිළිබඳව ප්‍රශ්න කිරීම ගැනද තමන්ට පාපයන් අලංකාරමත් කළ කිසියම් කෙනෙකු හෝ තමාට ප්‍රයෝජන නොවන බවද අමතකවී සිටිති. එබැවින් අල්ලාහ් වෙනුවෙන් මිනිසා දෙයක් වැළකී සිටියේනම්, ඒ වෙනුවෙන් අල්ලාහ් එයට වඩා ශ්‍රේෂ්ඨමත් දෙයක් ඔහුට ලබාදීම ගැන මිනිසා සිතා බැලිය යුතුයි.

සමහර මිනිසුන් පාප ක්‍රියාවල අඛණ්ඩව යෙදමින් සිටිති. එයින් වැළකී සිටින ලෙස ඔවුන්ට උපදෙස් කරන විට ඔවුහු 'නියතව, අල්ලාහ් ඉමහත් සමාවන්තයා හා කරුණාවන්ත යාය' යනුවෙන් පවසති. සත්සුදක්සේ මෙය මෝඩකම හා ෂෙයිතාන්ගේ නොමග යැවීමකි. මක්නිසාද යත්, නියතව, අල්ලාහ්ගේ දායාදයන් යහපත් ශීලයන්ට හැර හිතුවත්කාර කමින් පාප ක්‍රියාවල යෙදෙන අයහපත් ශීලයන්ට නොවන් නේය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿إِنَّ رَحْمَتَ اللهِ قَرِيْبٌ مِّنَ الْمُحْسِنِيْنَ﴾ [الأعراف: ٥٦]

නියත වශයෙන්ම අල්ලාහ්ගේ දායාදය (යහකම් කරන) යහපත් ශීලීන්ට සමීපව තිබේ.

(අල්කුර්ආන් -7:56)

අල්ලාහ් ඉතා සමාවන්තයා හා කරුණා වන්තයා ලෙස සිටින අතර, ඔහු දැඩි දඬුවම් කරන්නා ලෙසද සිටී. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿نَبِّئْ عِبَادِيْ أَنِّيْ أَنَا الْغَفُوْرُ الرَّحِيْمُ ، وَأَنَّ عَذَابِيْ هُوَ الْعَذَابُ الْأَلِيْمُ﴾

[الحجر: ٤٩، ٥٠]

(ම් : නබි) නියත වශයෙන්ම, ඉමහත් සමාවන්නයා හා කරුණා වන්තයා මමම බවත්, තවද නියතව, මාගේ දඬුවම ඉතාමත් කෘෲර බවත් ඔබ මගේ වහලූන්ට දැනුම් දෙන්න.
(අල්කුර්ආන් -15: 49,50)

# පාපොච්චාරණයෙහි කොන්දේසි

සත්‍ය පාපොච්චාරණය සඳහා ආගමික විද්වතුන් අල්කුර් ආනයෙන් සහ නබි වදනෙන් උපුටා ගෙන සමහර කොන් දේසි පණවා ඇත. ඒවා මෙසේය.

1-වහාම එම පාපයෙන් ඉවත්වීම.
2-සිදුවූ පාපය ගැන කණගාටුවීම.
3-මෙවැනි පාපයන්හි නැවත වරක් නොයෙදෙන බවට ස්ථිර (අධිටන්)කර ගැනීම.
4-තමා විසින් පීඩාවට ලක්වූ තැනැත්තාගේ අයිතිවාසි කම ඔහුට නැවත ලබාදීම හෝ ඔහුගෙන් සමාව ලබා ගැනීම. නබිනායක (සල්) තුමා මෙසේ පවසන්නේය.

[مَنْ كَانَ عِنْدَهُ لأَخِيْهِ مَظْلَمَةٌ مِنْ مَالٍ أَوْ عِرْضٍ فَلْيَتَحَلَّلْهُ الْيَوْمَ ، قَبْلَ أَنْ لاَ يَكُوْنَ دِيْنَارٌ وَلاَ دِرْهَمٌ إِلاَّ الْحَسَنَاتُ وَالسَّيِّئَاتُ] (رواه البخاري)

කවරෙක් හෝ තම සහෝදරයාට ඔහුගේ ධනයෙහි හෝ ඔහුගේ නම්බුවට අපරාධයක් කළේනම්, දීනාර් හෝ දිර්හම් පල නොදෙන එම පරලොව දිනය පැමිණීමට පෙර අදම ඔහුගෙන් සමාව අයැදින්න. එදින පල දෙනු ලබන්නේ කුසල් හා අකුසල්වලට පමණි.
(ග්‍රන්ථය : බුහාරි)

නමුදු, කෙනෙකුගේ අයිතිවාසිකම ලබා දීම සඳහා දැඩි ලෙස උත්සාහ කළත්, නොහැකි වූයේ නම්, ඒ වෙනුවෙන් අල්ලාහ්ගේ සමාව අපේක්ෂා කළ යුතුයි.

# සමහර අයිතිවාසිකම්

## අ-ධනය පිළිබඳ අයිතිවාසිකම්

කෙනෙකුගේ සම්පතක් කෙරෙහි අපරාධයක් කළ අය කුමණ මාර්ගයකින් හෝ එම අයිතිවාසිකම හිමිකරුට භාර දිය යුතුයි. නොඑසේ නම්, මහුගෙන් සමාව ලබා ගත යුතුයි. හිමිකරුව මහු නොදැන සිටියේ නම්, හෝ මහුව සොයා ගැනීමට අපහසුවූයේ නම් හෝ මහුගෙන් පැහැරගත් ප්‍රමාණය අමතක වූයේනම්, එයට ගැලපෙන ප්‍රමාණයක් තීරණය කර එය දානය කළ යුතුයි.

## ආ-ශරීරය පිළිබඳ අයිතිවාසිකම්

අපරාධය කළ තැනැත්තා එයට ලක්වූ තැනැත්තා වෙත ගොස් මුදලින් අලාභයක් ලබා ගන්නා ලෙස හෝ තමා ගෙන් පළිගන්නා ලෙස හෝ සමාව ලබාදෙන ලෙස හෝ විසඳුමක් ලබා දෙන ලෙස හෝ තමාව මහුට භාර කළ යුතුයි. අපරාධයට ලක්වූ අය කවරෙක් දැයි නොදන්නේ නම්, මහු වෙනුවෙන් දානය කර, ප්‍රාර්ථනා කළ යුතුයි.

## ඉ-ගෞරවය පිළිබඳ අයිතිවාසිකම්

මෙය අපහාස කිරීම, කේලාම් කීම, දොස්පද කීම, හා සමාජ සම්බන්ධතාවය විසන්ධි කිරීම යනාදීන්ය. මෙවන්

කාර්යයක් කවරෙකුට හෝ කළේනම්, එයට ලක්වූ අය වෙත ගොස් ඔහුගෙන් සමාව ලබා ගත යුතුයි. එසේම, ඔහු පරිහානිය ලක්කළ කරුණ හැකිතාක් නිවැරදි කළ යුතු අතර, ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනාද කළ යුතුයි.

# පාපොච්චාරණයෙහි කොටස්

## අ-ඝාතනයට අයත් පාපොච්චාරණය

මිතැකමින් සාතනයක් කළ කෙනෙකුට වගකීම් තුනක් අනිවාර්යවේ.

1-අල්ලාහ්ගේ අයිතිවාසිකම - මහා පාපයන් වෙනුවෙන් කණගාටුවී සත්‍ය පාපොච්චාරණයක් කිරීමක් මගින් මෙය ඉටුකළ හැක.

2-සාතනයට ලක්වූ තැනැත්තාගේ හිමිකරුවන්ගේ අයිති වාසිකම - තමාගෙන් පළිගැනීමෙන් හෝ වන්දියක් ලබා ගැනීමෙන් හෝ තමාහට සමාවක් ලබා දීමෙන් හෝ ඔහුන්ගේ අයිතිවාසිකම ලබාදීම සඳහා සාතකයා තමාව ඔවුන් වෙත භාරදිය යුතුයි. මෙසේ කිරීමෙන් ඔවුන්ගේ අයිතිවාසිකම ඉටු කළ හැක.

3-සාතනයට ලක්වූ අයගේ අයිතිවාසිකම - මෙම අයිති වාසිකම මෙලොවේදී ඉටු කළ නොහැක. සාතකයා යහපත් භාවයෙන් පාපොච්චාරණය කර, සාතනයට ලක්වූ තැනැත්තාගේ ඥාතීන් වෙත තමාව භාර කළ යුතුයි. එකළ අල්ලාහ් ඒ වෙනුවෙන් ඔහුට සමාවක් ලබා දෙයි. පරලොව දිනයේදී සාතකයාගේ කුසලින් ඔහුට වන්දි ලබා දෙයි.

## ආ- පොලියට අයත් පාපොච්චාරණය

පොලිය ලබා ගත් තැනැත්තා ඒ වෙනුවෙන් පාපොච්චාරණය කිරීමට පෙර පොලිය ලබාගැනීම අත හැරීම, මින් ඉදිරියට පොලිය නොගන්නා බවට තහවුරු කර ගැනීම හා කළ වරද්ද සඳහා කණගාටු වීම යනාදි කොන්දේසි අනුගමනය කළ යුතුයි. කෙනෙකු වෙත ඇති පොලිය මගින් ලැබූ මුදල පිළිබඳ නීතිරීතීන් ගැන ආගමික විද්වතුන් විවිධ මත භේදවලට පත්වූහ.

එනමුත්, අෂ්ෂෙයික් ඉබ්නු තෛමියා (රහ්), අෂ්ෂෙයික් ඉබ්නු සඃදී (රහ්) සහ අෂ්ෂෙයක් මුහම්මදු බින් සාලිහ් අල් උතෛමීන් (රහ්) යනාදි විද්වතුන් පුද්ගලයෙක් තමා පාපොච්චාරණය කිරීමට පෙර ලබා ගත් පොලිය පරිහරණය කළ හැකි අතර, එය තමාගේ මූලධනයෙන් ඉවත් කිරීම අනවශ්‍යවේ. නමුදු, තමා අත්පත් නොකළ පොලී මුදල ලබා ගත නොයුතුයි. මේ පිළිබඳව අල්ලාහ් පවසන පහත සඳහන් වැකිය මෙයට සාධකයකි.

﴿وَأَحَلَّ اللَّهُ الْبَيْعَ وَحَرَّمَ الرِّبَا فَمَنْ جَاءَهُ مَوْعِظَةٌ مِنْ رَبِّهِ فَانْتَهَى فَلَهُ مَا سَلَفَ وَأَمْرُهُ إِلَى اللَّهِ﴾ [البقرة:٢٧٥]

තවද අල්ලාහ් වෙළඳාම අනුමත කොට, පොලිය තහනම් කළේය. එබැවින්, (ඔබලාගෙන්) කවරෙකුට තම ස්වාමියාගෙන් සිට (පොලිය කෙරෙහි අවවාද කොට) උපදෙස් පැමිණ පසු (එය අතහැර) වැළකී සිටියේද, (ඔහු එයට) පෙර (ලබා) ගත් දෙය ඔහුටම හිමි වේ. තවද, ඔහුගේ කාර්ය අල්ලාහ්ගේ වෙතය.

(අල්කුර්ආන් - 2:275)

# සත්‍ය පාපොච්චාරණය

පාපොච්චාරණයක් පිළිගැනීමට එය අල්ලාහ් වෙනුවෙන් යනු පවිත්‍ර චේතනාවෙන් පමණක් පවතිය යුතුයි. මිනිසුන් අතර කීර්තියක් හෝ රැකියාවෙන් තමාට නම්බුවක් හෝ ලැබීම සඳහා පුද්ගලයෙක් පාපයන්හි යෙදීමෙන් වැළකී සිටියේනම්, එය පාපොච්චාරණයක් නොවන්නේය. තම ශරීර ආරෝග්‍යයට බියවී කෙනෙකු පාප කිරීමෙන් වැළකී සිටියේ නම්, උදාහරණයක් වශයෙන් ලෙඩට බියවී දුරාචාරයෙහි යෙදීමෙන් වැළකී සිටියේනම්, ඔහුද පාපොච්චාරණය කළ අයෙකු නොවන්නේය.

සොරකම් කිරීමට නොහැකිවීම හෝ මුරකාරයාට බිය වීම හෝ මෙවන් හේතු මත සොරකම් කිරීමෙන් කෙනෙකු වැළකී සිටින්නේ නම්, ඔහුද පාපොච්චාරණය කළ අයෙකු නොවන්නේය. බංකොලොත්වීමට බියවී පුද්ගලයෙක් මත් පැන් සහ මත් ද්‍රව්‍ය පානය කිරීමෙන් වැළකී සිටියේ නම්, ඔහුද පාපොච්චාරණය කළ අයෙකු නොවේය. එසේම, තම අරමුණට පටහැනි බැවින් පාප ක්‍රියාවක යෙදීමට නොහැකි වූයේද, ඔහුද පාපොච්චාරණය කළ අයෙකු නොවන්නේය.

තමා කළ පාප ක්‍රියාවන් කෙතරම් නින්දිත හා නරක බව පාපොච්චාරණය කරන්නා සිතා බැලිය යුතුයි. මක්නිසා දයත්, පාපොච්චාරණය කරන අවස්ථාවෙහි පෙර කළ පාප යන් සිහිවන විට සතුටක් හා ප්‍රීතියක් හැගෙන්නේ නම්, හෝ ඉදිරියේදී මෙවන් පාප ක්‍රියාවන් නැවත කිරීමට ප්‍රියක් හෝ ඇල්මක් වන්නේ නම්, එයද සත්‍ය පාපොච්චාරණයක් නොවන්නේය.

එසේම, මද්‍යපාන ද්‍රව්‍ය, විනෝද භාණ්ඩ, රූප, අසභ්‍ය පිළිමයන් යනාදී තම සතුව ඇති සෑම දේ සහමුලින්ම ඉවත් කළ යුතුයි. පාප කිරීමට සහය දැක්වූ අයගෙන් හා මිතුරන් ගෙන්ද ඉවත් විය යුතුයි. නරක මිතුරන්ගෙන් සමහරුන් තවත් සමහරුන්ට පරලොවේදී ශාප කරති. එනිසා, ඔවුන්ව යහමග කරා කැඳවීමට හා ඔවුන් ශීලාචාර කිරීමට අපහසු වන්නේ නම්, ඔවුන්ගෙන් ඉවත්වී සිටීම පාපෝච්චාරණය කරන්නාට අනිවාර්ය වේ.

පාපෝච්චාරණය කළ අය තම නරක මිතුරන් යහ මග කරා කැඳවීමට නොහැකි තරමට අසරණයා ලෙස සිටියත්, සමහර අවස්ථාවල ෂෙයිතාන් එම නරක මිතුරන් සමග සම් බන්ධවූවිට 'ඔවුන් යහමග කරා කැඳවීමට හැකි' බව පවසා ඔවුන් සමග සම්බන්ධතාවය පවත්වීම අලංකාරමත්ව පෙන් වයි. පසුව ඔහු නැවත පාප ක්‍රියාවල යෙදීමට මෙයම හේතු වේ. එබැවින්, පාපෝච්චාරණය කළ තැනැත්තා නරක මිතු රන් වෙනුවට කුසල් කිරීමට සහායවන හා කුසල් කරා මග පෙන්වන යහපත් මිතුරන් තෝරා ගත යුතුයි.

# පාපෝච්චාරණයට සහයවන කරුණු

## 1-අල්ලාහ් වෙනුවෙන් යනු පවිත්‍ර චේතනාව

මෙය පාප ක්‍රියාවලින් වැළකී සිටීමට අයත් ඉමහත් පල දායික මාර්ගයෙකි. මිනිසෙක් පිරිසිදු චේතනාවෙන් හා සත්‍යයෙන් පාපෝච්චාරණය කළේනම්, පාපයෙන් වැළකී සිටීමට අල්ලාහ් ඔහුට උපකාර කරන අතර, පාපෝච්චාර ණය කිරීමට පවතින බාධාවන් ඉවත් කරයි.

## 2-ආත්මය සමග සටන් කිරීම

පාප ක්‍රියාවලින් වැළකී සිටීම සඳහා මිනිසා තම ආත්මය සමග සටන් කළේ නම්, අල්ලාහ් ඔහුට උපකාර කරයි. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وَالَّذِينَ جَاهَدُوا فِينَا لَنَهْدِيَنَّهُمْ سُبُلَنَا وَإِنَّ اللهَ لَمَعَ الْمُحْسِنِينَ﴾

[العنكبوت:٦٩]

තවද, කවරෙක් අප මාර්ගයෙහි (ගමන් කිරීමට) වෙයම් කරන්නේද, නියත වශයෙන්ම අපි ඔවුන්ට අපගේ (යහ පත්) මාර්ග (විවෘතකර) පෙන්වන්නෙමු. නිසැකයෙන්ම අල්ලාහ් යහපත් ශීලයන් සමග සිටී.

(අල්කුර්ආන් - 29:69)

## 3-පරලොව සිහි කිරීම

අල්පවූ මෙලොව, එහි අස්ථිරතාවය, අල්ලාහ්ට කීකරුවී ක්‍රියා කරන්නන්ට පරලොවේ ලැබෙන විවිධ දායාදයන්, අල්ලාහ්ට විරුද්ධකම් කරන්නන්ට ලැබෙන කෘර දඬුවම් යනාදීන් කෙරෙහි මිනිසා සිහි කරන්නේනම්, ඔහු පාපයන්හි යෙදීමට ඒවා ඉමහත් බාධාවන් ලෙස පවතී.

## 4-පලදායක කාර්යයන්හි යෙදීම හා තනිවීම, විවේක වීමෙන් වැළකීම

විවේකයෙන් සිටීම පාපයන්හි පිවිසීමට වැදගත් හේතු වේ. එහෙයින්, මිනිසා තම දහම හා මෙලෝ ජීවිතයට අවශ්‍ය කාර්යයන්හි යෙදෙන්නේ නම්, ඔහුට පාපයන්හි යෙදීමට අවස්ථා නොලැබේ.

## 5-පාපයන් සිහිකරන හා උනන්දු කරන දෙයින් වැළකීම

පාප කාර්යයන්හි යෙදීමට උනන්දු කරන සියල්ලෙන්ම වැළකී සිටිය යුතුයි. එසේම සිනමා බැලීම, අසභ්‍ය ගීත වලට සවන්දීම, නරක පොත්පත් සහ අනවශ්‍ය සඟරා කියවීම හා මෙවැනි කාම හැඟීම උනන්දු කරන සැම ගෙන් වැළකී සිටීම අවශ්‍ය වේ.

## 6-යහපතුන් සහවාසය කිරීම හා අයහපතුන්ගෙන් දුරස්වීම

යහපතුන් සමග සහවාසය කිරීම කුසල් කිරීමට උපකාර වන අතර, යහපතුන්ගේ යහ මග අනුගමනය කිරීමටද මිනිසාට උනන්දුව දක්වයි. එසේම අකුසල් කිරීමෙන් හා නොමග යාමෙන් මහුව වළක්වයි.

## 7-ප්‍රාර්ථනා කිරීම

ප්‍රාර්ථනා කිරීම ඉමහත් ප්‍රයෝජනවත් ඖෂධයෙකි. එය විශ්වාස වන්තයන්ගේ ආයුධයක් වන අතර, ඔවුන්ගේ අරමුණු ඉටුකර ගැනීමේ බලවත් මාර්ගයෙකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وقال ربكم ادعوني أستجب لكم﴾ [غافر: ٦٠]

'(ඔබලා) මාගෙන්ම පමණක් ඔබලා ප්‍රාර්ථනා කරන්න. මම ඔබලා(ගේ ප්‍රාර්ථනාවල)ට පිළිතුරු ලබා දෙන්නෙමි' යනුවෙන් ඔබලාගේ ස්වාමියා පවසන්නේය.

(අල්කුර්ආන් - 40:60)

﴿ادعوا ربكم تضرعا وخفية﴾ [الأعراف:٥٥]

(එබැවින්, විශ්වාස වන්තයිනි) ඔබලාගේ ස්වාමියාගෙන් බැගෑපත් කමින් සහ (කටහඬ පහත්කර) රහස්ගතව (ඔබලාට අවශ්‍ය දේ ගැන) ප්‍රාර්ථනා කරන්න.

(අල්කුර්ආන්-7:55)

﴿وإذا سألك عبادي عني فإني قريب أجيب دعوة الداع إذا دعان فليستجيبوا لي وليؤمنوا بي لعلهم يرشدون﴾ [البقرة:١٨٦]

(මු : නබිවරයාණෙනි) මගේ වහලුන් මා පිළිබඳව ඔබෙන් විමසුව හොත්, 'නියත වශයෙන්ම, මා ඔවුන්ට ඉතාමත් සමීප බව පවසන්න. ප්‍රාර්ථනා කරන්නා මා අමතා ප්‍රාර්ථනා කළවිට ඔහුගේ ප්‍රාර්ථනාව මට ඇසී මම ඊට පිළිතුරු දෙන්නෙමි. එබැවින්, මගේ ඇමතීමට සවන් දී මා අදහත්වා. මින් ඔවුන්ට නිවැරදි මග පෙන්වීම ලබා ගැනීමට ඉඩ තිබේ. (යනුවෙන් පවසන්න.)

(අල්කුර්ආන්-2:186)

# පාපයන් සඳහා ප්‍රතිකාර

අල්ලාහ් තම වහලුන්ට අනිවාර්ය කර ඇති වන්දනාමාන යන් අතර, සමහරයන් ඔවුන්ගේ සුළු පාපයන් මුකා විනාශ කරන දෙය ලෙස පැවතීම අල්ලාහ්ගේ භාග්‍යයකි. එවායින් සමහරයන් මෙසේය.

## 1-පස්වේල නැමදුම

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[أَرَأَيْتُمْ لَوْ أَنَّ بِبَابِ أَحَدِكُمْ نَهْرًا غَمْرًا يَغْتَسِلُ فِيْهِ كُلَّ يَوْمٍ خَمْسُ مَرَّاتٍ هَلْ يَبْقَى مِنْ دَرَنِهِ شَيْءٌ ؟ قَالُوْا: لاَ يَارَسُوْلَ اللهِ، قَالَ: كَذَلِكَ الصَّلَوَاتُ الْخَمْسِ يَمْحُو اللهُ بِهِنَّ الذُّنُوْبَ وَالْخَطَايَا] (رواه أهل السنن)

ඔබලාගෙන් කෙනෙකුගේ ගේ දොරටුව අසලින් ගැඹුරු ගඟක් දුවන්නේය. එහි ඔහු දිනපතා පස් වතාවක් ජල ස්නානය කළේනම් ඔහුගේ ශරීරයෙහි කිසිදු කිලිටුවක් ඉතිරිව පවතීද ? යනුවෙන් නබිනායක තුමා (සිය ශ්‍රාවකරුවන්ගෙන්) විමසුවේය. එකළ ඔවුහු අල්ලාහ්ගේ දූතයාණෙනි, කිසිවක් ඔහුගේ ශරීරයෙහි ඉතිරිව නොපවතී යනුවෙන් කීහ. පසුව නබිතුමා 'පස්වෙල නැමදුමද එසේමයි. එමගින් අල්ලාහ් ඔහුගේ වැරදි හා පාපයන් මකා විනාශ කරයි' යනුවෙන් පැවැසීය.

(ග්‍රන්ථය : අහ්ලුස් සුනන්)

## 2-ජුම්ආ නැමදුම

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[مَنْ تَوَضَّأَ فَأَحْسَنَ الْوُضُوْءَ، ثُمَّ أَتَى الْجُمْعَةَ فَاسْتَمِعَ وَأَنْصَتَ ، غُفِرَ لَهُ مَا بَيْنَهُ وَبَيْنَ الْجُمْعَةِ الْأُخْرَى وَزِيَادَةُ ثَلاثَةِ أَيَامٍ ...] (رواه مسلم)

කවරෙක් වුදුවනය (වුළු) කර, එයද නිසියාකාරව කර, පසුව ජුම්ආවට පැමිණ නිශ්ශබ්දව සිට ජුම්ආ දේශනාව සවන්දී අසා සිටින්නේද, එම ජුම්ආව සිට අනෙක් ජුම්ආව සහ තවත් දින තුනක් දක්වා අතර සිදුවූ ඔහුගේ පාපයන් සඳහා සමාව ලැබෙන්නේය.

(ග්‍රන්ථ : මුස්ලිම්)

## 3-රමලාන් උපවාසය

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[مَنْ صَامَ رَمَضَانَ إِيْمَانًا وَاحْتِسَابًا ، غُفِرَ لَهُ مَا تَقَدَّمَ مِنْ ذَنْبِهِ]

(رواه البخاري ومسلم)

කවරෙක් හෝ විශ්වාසයෙන් හා කුලිය ලැබීමේ අපේක්ෂාවෙන් රමලාන් උපවාසයෙහි යෙදෙන්නේනම්, ඔහුගේ පෙර පාපයන් සඳහා සමාව ලබාදෙනු ලැබේ.

(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)

## 4-හජ් කර්තව්‍යය

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[مَنْ حَجَّ فَلَمْ يَرْفُثْ وَلَمْ يَفْسُقْ رَجَعَ مِنْ ذُنُوْبِهِ كَيَوْمِ وَلَدَتْهُ أُمُّهُ]

(متفق عليه)

කවරෙක් හෝ සංසර්ගයෙහි නොයෙද, අකුසල් කාර්යයන් නොකර හජ් කර්තව්‍යය ඉටු කරන්නේ නම්, ඔහු (පාප නොකළ) එදින උපන් බිළින්දෙකු සේ පිටත්වේ.

(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)

## 5-අරෆා උපවාසය

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[صَوْمُ يَوْمِ عَرَفَةَ يُكَفِّرُ السَّنَةَ الْمَاضِيَةَ وَالْبَاقِيَةَ] (رواه أحمد)

අරෆා දින උපවාසයෙහි යෙදීම පෙර වසරක හා ඉතිරි වසරක පාපයන් සඳහා ප්‍රතිකාරයක් ලෙස පවතී.

(ග්‍රන්ථය : අහ්මද්)

## 6-ලෙඩ හා කරදර

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[ما يصيب المسلم من نصب (تعب) ، ولاوصب (مرض) ، ولا هم ، ولا حزن، ولا أذى، ولا غم ، حتى الشوكة يشاكها إلا كفر الله بها من خطاياه] (متفق عليه)

මුස්ලිමෙකුට දුෂ්කරතාවය, ලෙඩ, කම්පනය, ශෝකය, වේදනාව හා පාදයෙහි කටුටක් ඇණීම යනාදී පීඩාවන් සිදුවූවද, නියත වශයෙන්ම අල්ලාහ් ඒවා ඔහු කළ වැරදි වලට ප්‍රතිකාරයක් වශයෙන් පරිවර්තනය කරයි.

(ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)

[من يرد الله به خيرا يصب منه] (رواه البخاري)

අල්ලාහ් කවරෙකුට හෝ කුසලක් (ලබාදීමට) සිතන්නේ නම්, ඔහුව අල්ලාහ් පරීක්ෂාවට ලක්කරයි.

(ග්‍රන්ථය : බුහාරි)

## 7-සමාව අයැදීම

කුමන කාර්යයන් පාපයන් සඳහා ප්‍රතිකාරය වන්නේද, එවන් කාර්යයන් අතර ඉමහත් ප්‍රතිකාරයක් ලෙස පවතින්නේ සමාව අයැදීමකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وما كان الله معذبهم وهم يستغفرون﴾ [الأنفال: ٣٣]

තවද ඔවුන් පව් සමාව අයැද සිටින අවස්ථාවෙහි අල්ලාහ් ඔවුන්ට වේදනා කරන්නෙකු ලෙස නොසිටි.

(අල්කුර්ආන්-8:33)

නබිනායක මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

[طوبى لمن وجد في صحيفته استغفارا كثيرا] (رواه ابن ماجة والبيحقي)

කවරෙකුගේ පුස්තකයෙහි අධිකව පව් සමාව අයැද බව සඳහන්වී තිබේද, ඔහුට සුභාසිංසනය ලැබේවා.
(ග්‍රන්ථ : ඉබ්නු මාජා හා බයිහකි)

# ප්‍රශ්නෝත්තර

## 1-ප්‍රශ්නය :

මම පාපොච්චාරණය කිරීමට අදහස් කරමි. නමුදු මගේ පාපයන් ඉතා අධිකය. පසුගිය වසරවල මා කළ සියළුම පාපයන් සඳහා අල්ලාහ් මාහට සමාවක් ලබා දෙයිද ?

## උත්තරය :

අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿قل يا عبادي الذين أسرفوا على أنفسهم لا تقنطوا من رحمة الله إن الله يغفر الذنوب جميعا، إنه هو الغفور الرحيم﴾ [الزمر:٥٣]

'තම ආත්මයට (එරෙහිව තමන් විසින්ම) සීමා ඉක්මවා ගොස් (අපරාධ කර) සිටින මාගේ දාසයිනි. අල්ලාහ්ගේ දායාදයන් (පව් සමාව) පිළිබඳ අපේක්ෂාව නැති නොකරන්න. නියතව, අල්ලාහ් (ඔබලාගේ) සෑම පාපයන් සඳහාම (පාපොච්චාරණය කළේනම්) සමාව ලබාදෙයි. (මක්නිසාදයත්) නිසැකයෙන්ම ඉමහත් සමාවනීය කරුණාවන්තයා ඔහුමය වේ' යැයි (නබි) ඔබ පවසන්න.
(අල්කුර්ආන් -39:53)

අල්ලාහ් ප්‍රකාශ කළ බව නබි නායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[ياابن آدم إنك ما دعوتني ورجوتني غفرت لك على ماكان فيك ولا أبالي، ياابن آدم لو بلغت ذنوبك عنان السماء ثم استغفرتني غفرت لك ولا أبالي، ياابن آدم إنك لو أتيتني بقراب الأرض خطايا ثم لقيتني لاتشرك بي شيئا لأ تيتك بقرابها مغفرة] (رواه الترمذي)

ආදම්ගේ පුත්‍රයෙනි, මා වෙත අපේක්ෂාව තබා මගෙන් ප්‍රාර්ථනා කළේනම්, මම කිසිවක් නොසළකා ඔබ කළ පාප කාර්යයන් සියල්ලටම සමාව ලබා දෙමි. ආදම්ගේ පුත්‍රයනි, ඔබ කළ පාපයන් අහස් පිරෙන ප්‍රමාණයට තිබී ඒ ගැන මා වෙත සමාව අයැද සිටියේනම්, මම කිසිවක් නොසළකා ඔබට සමාව ලබා දෙමි. ආදම්ගේ පුත්‍රයෙනි, ඔබ මේ පොළොව පිරෙන තරමට පාපයන් කර, මාහට කිසිවක් හෝ සමාන නොකර මාව බැහ දකින්නේනම්, (පාපොච්චාරණය කළේනම්) එම පොළොව පිරෙන තර මට මාගේ සමාව ඔබට ලබා දෙමි.

(ග්‍රන්ථය : තිර්මිදි)

අල්ලාහ් දාසයන්හට ලබා දී ඇති දායාදයන් මෙපමණක් නොව. මීට වඩා අධිකවේ. එනිසා සත්‍යයෙන් පාපොච්චා රණය කරන්නාගේ අකුසල් සියල්ල අල්ලාහ් කුසල් ලෙස පරිවර්තනය කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿إلا من تاب وآمن وعمل عملا صالحا فأولئك يبدل الله سيئاتهم حسنات، وكان الله غفورا رحيما﴾ [الفرقان:٧٠]

(පාපයන් පිළිබඳව) කවරෙක් පාපොච්චාරණය කර, විශ් වාසය කර හා කුසල් ක්‍රියාවන්හි යෙදෙන්නේද, එවැන් නන්ගේ පාප ක්‍රියාවන් කුසල් ක්‍රියාවන් බවට අල්ලාහ් පරිවර්තනය කරයි. තවද අල්ලාහ් ඉතා කරුණාවන්තයා හා සමාවන්තයා ලෙස සිටින්නේය.

(අල්කුර්ආන් - 25: 70)

## 2-ප්‍රශ්නය :

මම පාපොච්චාරණය කිරීමට අදහස් කරමි. නමුත් මගේ නරක මිත්‍රයන් මාව අත නොහැර සිටිති. මම මගේ අස රණකම දිටිමි. මා කුමක් කළ යුතුද ?

## උත්තරය :

මෙවැන්නන් ඉවසීමෙන් සිට පාපොච්චාරණයෙහි ස්ථිරව යෙදිය යුතුයි. මෙය ඔහුගේ පාපොච්චාරණයෙහි පවතින සත්‍යතාවය අසත්‍යතාවයෙන් වෙන්කර බැලීමේ පරීක්ෂා වකි. නමුත්, එම නරක මිත්‍රයන්ට වහල් නොවී අවධාන යෙන් සිටීම අනිවාර්යවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فاصبر إن وعد الله حق ولا يستخفنك الذين لا يوقنون﴾ [الروم:٦٠]

නමුදු (නබිවරයාණනි) ඔබ ඉවසීමෙන් සිටින්න. නියත වශයෙන්ම, අල්ලාහ්ගේ පොරොන්දුව සත්‍යයකි. එනිසා විශ්වාසයෙහි ස්ථිරතාවයක් නොමැති මවුන් ඔබව කැළ ඹීම් නොකරන්න. (අල්කුර්ආන් - 30:60)

පාපොච්චාරණයකර යහමගට යොමුවූ තැනැත්තා තමන් සමග නැවත එකතු කර ගැනීම සඳහා නරක මිත්‍රයන් විවිධ මාර්ග උපයෝගි කරති. පසුව ඔහුගේ සත්‍යභාවය

සහ සත්‍යයෙහි ඔහුට ඇති ස්ථිර භාවය ඔවුන් දැනගත් විගස ඔවුන් ඔහුව අතහැර දමති. මේ කෙරෙහි මිනිසා සිහිකර බැලිය යුතුයි.

**3-ප්‍රශ්නය** :

මා පාපොච්චාරණය කිරීමට අදහස් කරන්නෙමි. නමුත්, මාගේ පැරණි මිත්‍රයන්, මිනිසුන් අතර මාව අවනම්බුවට පත් කරන බවට තර්ජනය කරති. ඔවුන් වෙත මාගේ පිලිමයන් වැනි දේ ඇත. ඒවා ප්‍රසිද්ධවීමෙන් මගේ නම් බුවට හානි සිදුවේ දැයි මා බියට පත්ව සිටින්නෙමි. මා කුමක් කළ යුතුද ?

**උත්තරය** :

ප්‍රථමයෙන් මෙවැනි ෂෙතාන්ගේ මිත්‍රයන් සමග සටන් කරන්න. එකල ෂෙතාන්ගේ කුමන්ත්‍රණය අසරණ බව ඔබට හැගේ. ඔවුන්ට ඔබ වහල්වූයේ නම්, ඔබට විරුද් ධව වෙනත් චෝදනා රැස් කිරීමට ඔවුහු උත්සහ දරති. ඔබ ඔවුන්ට විරුද්ධවුවද නොවුවද ඔබ පරාජයටම පත් වේ. එබැවින්, ඔබ අල්ලාහ් වෙතම තවක්කුල් (වගකීම භාර) කරන්න. පසුව 'අල්ලාහ් මාහට ප්‍රමාණවත් වේ. ශ්‍රේෂ්ඨ ආරක්ෂකයා ඔහුමය' යනුවෙන් පවසන්න. නබි නායක මුහම්මදු (සල්) තුමා කිසියම් කණ්ඩායමක් පිළි බඳව බියට පත්වූයේනම්, මෙසේ ප්‍රාර්ථනා කරන්නේය.

[اللهم إنا نجعلك في نحورهم ، ونعوذبك من شرورهم] (أحمد وابو داود)

*අල්ලාහුම්ම ඉන්නා නජ්අලුක ෆී නුහුරිහිම්, වනඌදු බික මින් ෂුරූරිහිම්*

**තේරුම** :

ස්වාමිනී, ඔවුන්ට ඉදිරියෙහි ඔබව ඉදිරිපත් කරමු. තවද ඔබගෙන් ඔවුන්ගේ හානිය කෙරෙහි ආරක්ෂාව පතමු.
(ග්‍රන්ථ : අහ්මද් හා අබූදාවූද්)

මෙය දුෂ්කර දෙයක් බව සත්‍යයකි. නමුත්, අල්ලාහ් බිය භක්තිකයන් සමග සිටී. ඔහු ඔවුන්ව අතමං නොකරයි. බියභක්තිකයන් සමග අල්ලාහ් සිටින බව සනාථ කරන කථන්තරයක් කෙරෙහි ඔබ අවධානය යොමුකරන්න.

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ අනුගාමිකයෙක්වූ මර්සද් බින් අබී මර්සද් (රලි) තුමා මුස්ලිම් වරුන් අතර සිටී අසරණයන් මක්කාවෙන් සිට මදීනාව කරා (රහසිගතව) කැඳවාගෙන යන්නෙකු ලෙස සිටියේය. මක්කාවේ ගණිකා වෘත්තියෙහි යෙදී සිටී අනාක් නමැති ස්ත්‍රීය මර්සද්ගේ මිතුරියෙකි. මර්සද් පුද්ගලයෙකුට ඔහුව මදීනාවට කැඳවා ගෙන යන බවට පොරොන්දුවී සිටියේය. පසුව සිදුවූ සිද්ධිය ගැන මර්සද් මෙසේ පවසයි.

එම පුද්ගලයාව කැඳවාගෙන යාම සඳහා පසළොස්වක දිනක රාත්‍රියක් බිත්තියක සෙවණැල්ල අසලට පැමිණ සැඟවී සිටියෙමි. එවිට එහි පැමිණී අනාක් මාව දුටුවාය. ඇය මා අසලට පැමිණවිට මාව හඳුනා ගෙන 'එන්න අපි දෙන්නා මෙම රාත්‍රිය ගත කරමු' යනුවෙන් ආරාධනා කළාය. එවිට මම 'අනාක්, ගණිකා වෘත්තිය අල්ලාහ් තහනම් කර ඇත' යනුවෙන් කීමි. එවිගස ඇය 'මාගේ සමාජයෙනි, මෙම පුද්ගලයා ඔබලාගේ සිරකරුවන් රහසිගතව කැඳවා ගෙන යනවා' යනුවෙන් ශබ්ද නගමින්

කැගැසුවාය. වහාම අට දෙනෙක් මාව පසුපසෙන් එළවා ගෙන පැමිණියහ. මම ගුහාවක තුලට ඇතුලුවී සැඟව සිටියෙමි. ඔවුහු ගුහාව අසලටම, එනම් මා ළඟටම පැමිණියහ. නමුත් අල්ලාහ් මාව ඔවුන්ගෙන් සඟවා ආරක්ෂා කළේය. ඔවුන් පළාගිය පසු මම (මදීනාවට කැඳවාගෙන යාමට පොරොන්දුවූ) පුද්ගලයාව කැඳවා ගෙන ගියෙමි. අල්ලාහ් විශ්වාස වන්තයන් හා පාපොච්චාරණය කරන්නන් ආරක්ෂා කරන්නේ මෙසේය. යනුවෙන් කීය.

ඔබ බියවන දේ ප්‍රසිද්ධ වූයේනම්, ඒ ගැන පැහැදිළි කිරීමක් ඔබට අවශ්‍ය නම්, ඔබගේ ස්ථාවරය පිළිබඳව මිනිසුන්ට පැහැදිළි කරන්න. 'ඔව් මම පෙර පාප ක්‍රියවන්හියෙදී සිටියෙමි. නමුත් දැනට මම ඒවා වැරදි බව වටහා ගෙන අල්ලාහ්ගෙන් පාපොච්චාරණය කර සිටින්නෙමි' යනුවෙන් ඔබ ඔවුන්ට පවසන්න.

යථාර්තයෙන් සත්‍ය නින්දාව හා අවනම්බුව සිදුවන්නේ පරලොව දිනයේ අල්ලාහ්ගේද සෑම දේවදූත වරුන්ගේද ජින් හා මිනිස් වර්ගයන්ගේද ඉදිරියෙහි බව ඔබ වටහා ගත යුතුයි.

## 4-ප්‍රශ්නය :

මම කළ පාප ක්‍රියාවන් වෙනුවෙන් පාපොච්චාරණය කර එයින් නිදහස් වූයෙමි. පසුව මාගේ ආත්මය අභිබවා යාමෙන් නැවත එම පාප ක්‍රියාවල යෙදුනෙමි. එබැවින් මා පෙර කළ පාපොච්චාරණය නිශ්ප්‍රභ වෙයිද ? පෙර හා පසු කළ පාපයන් වෙනුවෙන් නැවත පාපොච්චාරණයක් කළ යුතුද ?

**උත්තරය** :

කවරෙක් පාපයක් වෙනුවෙන් පාපොච්චාරණය කළේද, අල්ලාහ් ඔහුගේ පාපොච්චාරණය පිළිගනී. ඔහු නැවත එම පාපයම කළේනම්, ඔහු අලුතින් පාපයක් කළ බව සළකන බැවින් ඒ වෙනුවෙන් පාපොච්චාරණයක් කිරීම අනිවාර්යවේ. පෙර කළ පාපොච්චාරණය නිවැරදි වේ.

**5-ප්‍රශ්නය** :

මම පාපයක් වෙනුවෙන් පාපොච්චාරණය කළෙමි. නමුදු වෙනත් පාපයක හිතුවක්කාර කමින් සිටිමි. මා කළ එම පාපොච්චාරණය පිළිගෙනු ලැබේද ?

**උත්තරය** :

එසේමයි. ඔබ කළ පාපොච්චාරණය පිළිගෙනේ. නමුදු, ඔබ හිතුවක්කාර කමින් සිටින පාපය (පෙර කළ) පාප වර්ගයට අයත් පාපයක් නොවිය යුතුයි. උදාහරණයක් වශයෙන්, පුද්ගලයෙක් පොලිය වෙනුවෙන් පාපොච්චාරණය කළේය. නමුත්, මත්පැන් පානය කිරීම වෙනුවෙන් පාපොච්චාරණය නොකළේය. එවිට පොලිය වෙනුවෙන් ඔහු කළ පාපොච්චාරණය පිළිගෙනේ. නමුදු කෙනෙක් මත්පැන් පානය කිරීම වෙනුවෙන් පාපොච්චාරණය කළා නමුත් මද්‍යපාන ද්‍රව්‍ය භාවිතා කිරීම වෙනුවෙන් පාපොච්චාරණය නොකළේය. හෝ පුද්ගලයෙක් ස්ත්‍රියෙකු සමග යෙදු දුරාචාරය වෙනුවෙන් පාපොච්චාරණය කළා නමුත් වෙනත් ස්ත්‍රියෙක් සමග දුරාචාරයෙහි සිටී. මෙම අවස්ථා දෙකකහිදී ඔහු කළ පාපොච්චාරණය පිළි නොගෙනේ.

## 6-ප්‍රශ්නය :

මම පසුගිය කාලයේ සලාතය, උපවාසය, සකාතය යන සමහර අනිවාර්ය කාර්යයන් ඉටු නොකළෙමි. මා කුමක් කළ යුතුද ?

## උත්තරය :

සලාතය (නැමදුම)නම්, එය නැවත ඉටුකළ නොයුතුයි. නමුත් එයට ප්‍රතිකාරයක් ලෙස පවිත්‍රතාවයෙන් පාපොච් චාරණය කළ යුතුයි. එසේම මින් ඉදිරියට නැමදුම රැක වරණයෙන් ඉටු කළ යුතු අතර, අධික වශයෙන් පාප සමාව අයැදීමෙන් හා පාපොච්චාරණය කිරීමෙන් නිරත විය යුතුයි. අල්ලාහ් එය සඳහා සමාව ලබා දීමට හැක. උපවාසයනම්, උපවාසයෙහි නොයෙදු කාලයේ මහු මුස් ලිමෙකු ලෙස සිටියේ නම්, එම උපවාසයන් නැවත ඉටු කළයුතු අතර, උපවාසයෙහි නොයෙදු සෑම දිනයක් සඳ හාම දිළින්ඳෙකු බැගින් ආහාර පානය ලබා දිය යුතුයි. සකාතයනම්, එය අනිවාර්යයෙන්ම ලබා දිය යුතුයි.

## 7-ප්‍රශ්නය :

මිනිසුන්ගේ සම්පත් සොරකම් කළ මම, පසුව අල්ලාහ් වෙතින් පාපොච්චාරණය කළෙමි. හිමිකරුවන්ට එම සම් පත් නැවත ලබා දීමට ඔවුන්ගේ ලිපිනයන් නොදනිමි. මා කුමක් කළ යුතුද ?

## උත්තරය :

හැකිතාක් ඔවුන් පිළිබඳව සොයා බැලීම ඔබට අනිවාර්ය වේ. ඔවුන් සොයා ගැනීමට හැකිවූයේනම් ඔබ සොරකම්

කළ දේ ඔවුන්ටම ලබා දෙන්න. අයිතිකරුවන් මලානම්, ඒවා ඔවුන්ගේ හිමිකරුවන්ට භාර දෙන්න. නමුදු, හැකි තාක් සොයා බැලුවද ඔවුන් සොයා ගැනීමට නොහැකි වූයේනම්, ඔවුන් වෙනුවෙන් ඒවා දානය කරන්න. ඔවුන් කාෆිර්වූවද ප්‍රශ්නයක් නොවේ. මක්නිසාද යත්, ඔවුන්ට අල්ලාහ් මෙලොවේ සම්පත් (දායාදයන්) ලබාදෙන අතර, පරලොවේ ඔවුන්ට ලබා නොදෙන්නේය.

## 8-ප්‍රශ්නය :

මම දුරාචාරයෙහි යෙදුනෙමි. එනිසා මා කෙසේ පාපොච්චාරණය කළ යුතුද ? එම ස්ත්‍රිය ගැබිණියක් වූයේනම්, එය මාගේ දරුවෙකු වේද ?

## උත්තරය :

ස්ත්‍රියෙකගේ කැමැත්තෙන් හා එකඟතාවයෙන් දුරාචාරය සිදුවූයේනම්, පාපොච්චාරණය කිරීම පමණක් ඔහුට අනිවාර්ය වේ. දරුවා ඔබට අයත් නොවන අතර, ඔහුට ගියවියදම් කිරීමද ඔබට අනවශ්‍ය වේ. මක්නිසාද යත්, එම දරුවා දුරාචාරයෙන් උපන්නකි. මෙවන් දරුවන්ගේ සම්බන්ධතාවය පවතින්නේ මව හා සමග පමණි.

(දුරාචාරයෙන් ඇතිවන) මෙම අවමානය සැඟවීම සඳහා පාපොච්චාරණය කළ පුද්ගලයා එම ස්ත්‍රිය විවාහ කිරීම තහනම්ය. එමෙන්ම ඔහු හා එම ස්ත්‍රිය පවිත්‍රතාවයෙන් පාපොච්චාරණය කළේනම්, ඇගේ ගර්භාෂයෙහි ගැබ්වී නොවීම පැහැදිලිවීමෙන් පසු ඇයව විවාහකර ගැනීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය.

**9-ප්‍රශ්නය** :

මම යහපත් පුද්ගලයෙකු සමග විවාහ වූයෙමි. විවාහයට පෙර මම අල්ලාහ්ගේ පිළිගැනීම නොවන සමහර කාර් යයන්හි යෙදුනෙමි. එබැවින්, මා කුමක් කළ යුතුද ?

**උත්තරය** :

ඔබ අල්ලාහ් වෙත සත්‍ය භාවයෙන් පාපොච්චාරණයක් කළ යුතු අතර, ඔබ විවාහයට පෙර කළ දේ ගැන ඔබ සැමියාට දැනුම් නොදිය යුතුයි.

**10-ප්‍රශ්නය** :

සමලිංගික සේවනය වෙනුවෙන් පාපොච්චාරණය කරන් නාට අනිවාර්යවූ කරුණු කුමක්ද ?

**උත්තරය** :

දෙපිරිසම විශේෂ පාපොච්චාරණයෙහි යෙදීම අනිවාර්ය වේ. මක්නිසාද යත්, නබි ලූත් (අලෛ) තුමාගේ සමාජ යන්ට, ඔවුන් කළ (මෙවැනි) මහා පාප ක්‍රියාවන් සඳහා අල්ලාහ්, අන් කිසියම් සමාජයන්ට හෝ පහළ නොකළ විවිධ වේදනාවන් පහළ කළ බව ඔවුහු නොදනිති. ඒවා මෙසේය.

1-ඔවුන්ගේ පෙනුම් භාවය පැහැර ගැනුන. ඔවුහු අන්ධ යන් බවට පත්වූහ.

2-පසුව ඔවුන් දෙස භයංකරමත් ශබ්දයක් පහළ වීය.

3-පසුව ඔවුන්ගේ නිවැස් විනාශ කෙරින. ඒවා අහස් දෙසට ඉස්සා පෙරළීය.

4-පසුව මවුන් දෙසට පිළිස්සුනු ගල් වර්ෂාවක් විසිරීය. එයින් මවුන් සැම දෙන මරණයට පත්වූහ.

එබැවින්, නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පව සත්තේය.

[من وجدتموه يعمل عمل قوم لوط فاقتلوا الفاعل والمفعول به]

(رواه أبو داود والترمذي وابن ماجة)

කවරෙක් හෝ නබි ලූත් (අලෛ) තුමාගේ සමාජය කළ කාර්යයෙහි යෙදීම ඔබලා දුටුවේ නම්, යෙදු තැනැත්තා හා යෙදවූ තැනැත්තා යන දෙදෙනාම මරා දමන්න.
(ග්‍රන්ථ : අබූදාවූද්, තිර්මිදි හා ඉබ්නු මාජා)

එබැවින්, මෙවැනි කාර්යයෙහි යෙදු අය සත්‍ය පාපොච්චාරණයක් කිරීම හා වැඩි වැඩියෙන් පව සමාව අයැදීම අනිවාර්ය වේ.

අවසාන වශයෙන්, සදාදර සහෝදරයෙනි,
මවක් තමාගේ දරුවාට කරන කරුණාවට වඩා නියතව, අල්ලාහ් තමාගේ දාසයන් කෙරෙහි ඉතා කරුණා වන්තයා ලෙස සිටී. සත්‍යභාවයෙන් කරන පාපොච්චාරණය අල්ලාහ් පිළිගනී. පාපොච්චාරණයෙහි දොරටුව කිසියම් දිනක හෝ වසනු නොලබන අතර, එය සැමදා විවෘතව පවතී.

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم،

والحمد لله رب العالمين.

# محتويات الكتاب ـ التوبة

# පටුන

**විෂය** **පිටුව**


1-පාපෝච්චාරණයේ විශේෂත්වය .......................... 3

2-පාපෝච්චාරණයෙහි කොන්දේසි .......................... 13

3-සමහර අයිතිවාසිකම් .......................... 14

4-පාපෝච්චාරණයෙහි කොටස් .......................... 15

5-සත්‍ය පාපෝච්චාරණය .......................... 17

6-පාපෝච්චාරණයට සහයවන කරුණු .............. 18

7-පාපයන් සඳහා ප්‍රතිකාර .......................... 21

8-ප්‍රශ්නෝත්තර .......................... 25

## أخي الكريم وأختي الكريمة

ندعوكم للمشاركة في إنجاح أعمال المكتب وتحقيق طموحاته من خلال إسهامكم بالأفكار والمقترحات والدعم المادي والمعنوي.

**فلا تحرم نفسك الأجر بالمشاركة في دعم أعمال المكتب**

## الدال على الخير كفاعله

| م | إسم الحساب | رقم الحساب | غرض الحساب |
| --- | --- | --- | --- |
| ١ | التبرعات العامة | ١٩٥٦٠٨٠١٠١٠٢٠٠٧ | خاص بتسيير أعمال المكتب كتكامل رواتب الدعاة والعاملين وخدمات أخرى |
| ٢ | تبرعات المكتب | ١٩٥٦٠٨٠١٠١٠٦٥٥٢ | خاص بطباعة الكتب والمطويات وغيرها |
| ٣ | تبرعات الزكاة | ١٩٥٦٠٨٠١٠١٠٨١٣٧ | خاص بأصناف الزكاة |
| ٤ | مقر المكتب | ١٩٥٦٠٨٠١٠١٣٣٥٥٦ | خاص بتشييد مباني المكتب |

الحساب الموحد لجميع حسابات المكتب (١٩٥٦٠٨٠١٠٢١٠٠٠٨) لدى مصرف الراجحي


المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف: [illegible] ناسوخ [illegible] ص ب [illegible] الرياض ١١٦٦٢ بريد إلكتروني E.mail : Sultanah22@hotmail.com



ردمك: ٩٩٦٠-٨٦٤-١٩-٧



0 0 5 0 1 6